සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

First Term Test - Grade 13 - 2020

විභාග අංකය ............................ නාට්‍ය හා රංගකලාව I කාලය පැය තුනයි

උපදෙස්

- I කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු I පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

01. න තජ්ඥානං න තජ්ශිල්පං
න සාවිද්‍යා න සාකලා
න සො යෝගෙන තත් කර්ම
නාට්‍ය ස්මිත් යන්න දෘෂ්‍යතෙ
මෙම ශ්ලෝකය සඳහන් වී ඇත්තේ
1. භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේය.
2. ධනංජයගේ දශරූපකයේය.
3. අභිනවගුප්තගේ දස පනතේය.
4. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයේය.
5. භට්ට නාරායනගේ චරිතාපදානයේය. (.........)

02. නළුවකුගේ හා නිළියකගේ ප්‍රධාන කාර්යභාරය වන්නේ,
1. දෙබස් හඬ නගා කීම.
2. පසුතල වර්ණනා කිරීම.
3. චරිතයක් නිරූපණය කිරීම.
4. රූසපුව රැකගැනීම.
5. අධ්‍යක්ෂ අනුගමනය කිරීම. (.........)

03. සංස්කෘත නාට්‍යයේ නියතාප්ති යනුවෙන් හඳුන්වන්නේ,
1. ගැටුම් අවස්ථාව ප්‍රබල වීම.
2. කරදර බාධා නැතිව කාර්ය ඉටුවීමේ නියත ස්වභාවයට පත්වීම.
3. අපේක්ෂා භංගත්වයට පැමිණීම.
4. කතා නායකයා හා කතා නායිකාව හමුවීම.
5. ධීවරයා ආදී සිදුවීම් ප්‍රධාන කතාවට සම්බන්ධ වීම. (.........)

04. ලෝක ධර්මි නාට්‍ය ධර්මි යන නාට්‍ය සම්ප්‍රදාය සම්බන්ධ වර්ගීකරණය සඳහන් වන්නේ,
1. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයේය
2. සෙඅම් ගේ ප්‍රෂිකදෙන්හිය.
3. නන්දිකේශ්වරගේ අභිනය දර්පණයේය
4. ධනංජයගේ දසරූපකයේය.
5. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයේය. (.........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

05. EFC ලුඩොවයික් නාට්‍යකරුවා සම්බන්ධ වන්නේ,

1. දේශීය දෙමළ නාට්‍ය කලාවටය.
2. නූතන සිංහල නාට්‍ය කලාවටය.
3. දේශීය ඉංග්‍රීසි නාට්‍ය කලාවටය.
4. විශ්වවිද්‍යාල සිංහල සංගමයටය.
5. විශ්ව විද්‍යාල සිංහල සමිතියටය. (.........)

06. පාස්කු නාට්‍ය කලාව ප්‍රචලිත වී ඇත්තේ,

1. මීගමුව, කුරුණෑගල, මහනුවර.
2. හලාවත, මීගමුව, ගාල්ල
3. ගාල්ල, මාතර, හම්බන්තොට
4. යාපනය, ත්‍රිකුණාමලය, කන්තලේ
5. දූව, පිටිපන, බොරලැස්ස (.........)

- **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාල කරගන්න.**

| | | |
|---|---|---|
| A - ගබඩා කොල්ලය. | B - පැපොල් පැලීම. | C - මරා ඉපැද්දීම. |
| D - කණ්ණාඩියෙන් මූණ බැලීම. | E - හැටපස් මංගල්‍යය. | F - දොරකඩ අස්න. |
| G - හිස පීරීම. | H - වැදි යක්කම. | I - ඇත් බන්ධන. |
| J - මිලින්ද ප්‍රශ්නය. | K - අඹ විදමන. | L - ගලක් බඩ බැඳීම. |
| M - පිරිත් පිංකම. | N - මත්ස්‍ය රූප දියට දැමීම. | O - තෝඩු පැළඳීම |

07. ඉහත වගුවේ උඩරට ශාන්තිකර්මය හා අදාල වන්නේ,

1. A D හා G ය. 2. E H හා J ය. 3. H K හා M ය. 4. A E හා H ය. 5. A C හා N ය. (.........)

08. ඉහත වගුවේ සබරගමු ශාන්තිකර්ම හා අදාල වන්නේ,

1. D I හා O ය. 2. C I හා K ය. 3. A C හා K ය. 4. I J හා L ය. 5. C G හා J ය. (.........)

09. ඉහත වගුවේ දොලහ පෙලපාලිය හා අදාල වන්නේ,

1. D G හා O ය. 2. B D හා F ය. 3. C G හා H ය. 4. K L හා O ය. 5. M N හා O ය. (.........)

10. ඉහත වගුවේ පූජාකර්ම හා අදාල වන්නේ,

1. B F හා K ය. 2. K M හා O ය. 3. F J හා M ය. 4. F H හා M ය. 5. K N හා E ය. (.........)

11. ඉහත වගුවේ අභිචාර සඳහා අදාල වන්නේ,

1. A C හා L ය. 2. A B හා C ය. 3. H L හා M ය. 4. B L හා N ය. 5 . A D හා H ය. (.........)

12. වංගෙඩිය, කුල්ල, මෝල්ගස, ආදී රංගභාණ්ඩ අයත් වන්නේ,

1. නාඩගම් නාට්‍යයට.
2. සොකරි නාටකයට.
3. කෝලම් නාට්‍යයට.
4. නූර්ති නාට්‍යයටය.
5. මිනර්වා නාට්‍යයටය. (.........)

13. කුවේණි වේදිකා නාට්‍යයට යොදාගත් පුරා වෘත්තය අන්තර්ගත ඓතිහාසික කෘතීන් වන්නේ,

1. මහා වංශය, කුවේණි අස්න, රාජාවලිය.
2. රාජාවලිය, බුත්සරණ, ධර්මප්‍රදීපිකා.
3. කුවේණි අස්න, බුත්සරණ, සද්ධර්මාලංකාරය.
4. රාජාවලිය, සුභාශිතය, බුදුගුණ අලංකාරය.
5. බුදුගුණ අලංකාරය, සුභාෂිතය, බුත්සරණ. (.........)

- **ප්‍රශ්න අංක 14 සිට 19 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාල කරගන්න.**

| | | |
|---|---|---|
| A - වන්නිය. | B - අන්තිම රාත්‍රිභෝජනය | C - පූර්ණ විරිදුව |
| D - තෙරික්කුත්තු | E - මහා සම්මත | F - මෝහන්ලාල් |
| G - ස්ථාවර පාත්‍ර | H - ලෝක ආරම්භය | I - මරණානුස්සති |
| J - කමත | K - විශ්වනාත්ලෞජි | L - වෙස්මුහුණු |
| M - අම්බලන්ගොඩ | N - මලවුන්ගෙන් නැගිටීම | O - සුරාසොඬ |
| P - සතා ශිවම් | Q - වෙදරාල | R - පරාභව |


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

14. සොකරි නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

1. C H හා Q ය. 2. A B හා E ය. 3. A J හා Q ය. 4. H J හා L ය. 5. A I හා P ය. (.........)

15. කෝලම් නාට්‍ය සඳහා අදාල වන්නේ,

1. A B හා E ය. 2. E G හා I ය. 3. J L හා O ය. 4. M P හා Q ය. 5. E L හා M ය. (.........)

16. නාඩගම් හා සම්බන්ධ වන්නේ,

1. C D හා G ය. 2. A C හා E ය. 3. D H හා I ය. 4. B G හා O ය. 5. A D හා M ය. (.........)

17. දූවේ පාස්කු දුක්ප්‍රාප්ති නාට්‍යයේ අවස්ථා වන්නේ,

1. A B හා C ය. 2. A G හා N ය. 3. O P හා Q ය. 4. B H හා N ය. 5. D H හා M ය. (.........)

18. ජෝන් ද සිල්වාගේ කාලීන සමාජ අත්දැකීම් පාදක කරගත් නාට්‍ය වන්නේ,

1. C I හා J ය. 2. I O හා R ය. 3. K M හා O ය. 4. A L හා R ය. 5. A Q හා R ය. (.........)

19. නූර්ති සංගීතඥයන් වේ,

1. B D හා F ය. 2. F H හා J ය. 3. A F හා G ය. 4. J K හා L ය. 5. F K හා P ය. (.........)

20. ලංකාවේ රඟ දක්වන ලද අලගනායිදු විසින් නිෂ්පාදනය කළ පැරණිම නාඩගම වන්නේ,

1. බැලසන්ත. 2. හරිස්චන්ද්‍ර. 3. ඇහැලේපොල. 4. මියුලින්. 5. සිංහවල්ලි. (.........)

21. ප්‍රභුපන්තිය සමච්චලයට ලක්කරමින්, කුලභේදය විග්‍රහ කරමින් විවිධ රාජ්‍ය අක්‍රමිකතා සහ සමාජ විෂමාචාර චරිත මගින් හුවා දක්වන්නේ,

1. නව නාට්‍ය වලය. 2. නූර්ති නාට්‍යයේය. 3. සොකරි නාට්‍යයේය.
4. නාඩගම් නාට්‍යයේය. 5. තෝලම් නාට්‍යයේය. (.........)

22. මුල්ම ටවර්හෝල් නාට්‍ය කරුවන් නොවන්නේ,

1. W.C.පෙරේරා. 2. පීටර් ද සිල්වා. 3. අලගනායිදු.
4. M.G. පෙරේරා. 5. D.J.W. ගුණතිලක. (.........)

23. සිරිසේන විමලවීරයන්ගේ නාට්‍ය නොවන්නේ,

1. රොඩී කෙල්ල. 2. පිටිසර කෙල්ල. 3. සිංහල වීරයා.
4. උමතු විශ්වාසය. 5. මායා දූත්නේ (.........)

24. මිනර්වා නාට්‍යයක් නොවන්නේ,

1. කඩවුණු පොරොන්දුව. 2. පෙරලෙන ඉරණම. 3. වැරදුණ කුරුමානම.
4. කවට අන්දරේ. 5. දියසේන. (.........)

25. රූපාදේවි, සූරියරාණි, ජොසපින් ජයලත්, හියුගෝ ප්‍රනාන්දු, ස්ටැන්ලි මල්ලවආරච්චි යන නළු නිළියන් රගපෑ නාට්‍යයන් වන්නේ,

1. ටීටර් නාට්‍ය. 2. මිනර්වා නාට්‍ය. 3. නාඩගම් නාට්‍ය. 4. නූතන නාට්‍ය.
5. කෝලම් නාට්‍ය. (.........)

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා පහත තොරතුරු අදාල කරගන්න.**

| | | |
|---|---|---|
| A - ස්වප්නවාසවදත්ත | B - භ්‍රමර | C - නාටක |
| D - සන්ධිම | E - අපවාරිත | F - ප්‍රකරණ |
| G - ව්‍යාජිම | H - හංසාස්‍ය | I - අවිමාරක |
| J - රහස්‍ය කථනය | K - ජනාන්තික | L - දූතවාක්‍ය |
| M - ඩීම | N - චේෂ්ටික | O - ත්‍රිපතාක |

26. නාට්‍ය ශාස්ත්‍රයේ සඳහන් හස්ත භාවිතය සම්බන්ධයෙන් අදාල වන්නේ,

1. B H හා O ය. 2. A C හා O ය. 3. D H හා L ය. 4. A B හා G ය. 5. H J හා K ය. (.........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

27. සංස්කෘත නාට්‍ය කරුවකු වන භාසගේ නාට්‍ය වන්නේ.

1. A B හා C ය. 2. A D හා I ය. 3. A I හා L ය. 4. B L හා N ය. 5. D I හා K ය. (.........)

28. සංස්කෘත නාට්‍ය භාෂණ විධින් වන්නේ.

1. A E හා G ය. 2. G J හා I ය. 3. I K හා M ය. 4. E J හා K ය. 5. E F හා K ය. (.........)

29. සංස්කෘත නාට්‍ය ප්‍රභේද වලට අයත් වන්නේ,

1. A B හා C ය. 2. A F හා O ය. 3. K L හා M ය. 4. C E හා H ය. 5. C F හා M ය.. (.........)

30. සංස්කෘත නාට්‍යයේ ප්‍රස්ත වර්ග 03 වන්නේ,

1. D G හා N ය. 2. B D හා I ය. 3. A G හා K ය. 4. C N හා O ය. 5. A H හා M ය. (.........)

31. ලංකා විශ්ව විද්‍යාලයීය නාට්‍ය සංගමයේ පුරෝගාමියා වන්නේ,

1. ඊ.එෆ්.සී. ලුඩෝවයික්. 2. නියුමාන් ජුබාල්. 3. ඇෂ්ලි හල්පේ.
4. මොලියේර්. 5. ඉයුජින් ඕනීල්. (.........)

32. රූපණය පිළිබඳව Method Acting හඳුන්වාදුන්නේ,

1. බර්ටෝල්ට්බ්‍රෙෂ්ට්. 2. ස්ටැනිස්ලාවුස්කි. 3. ශේක්ස්පියර්.
4. භරතමුනි. 5. ඇරිස්ටෝටල්. (.........)

- **අංක 33 සිට 36 දක්වා ප්‍රශ්න සඳහා කරුණු/සංකල්ප නාම, පහ බැගින් දී ඇත. ඒ අතරින් සෙසු පද හා නොගැලපෙන පදය තෝරන්න.**

33. 1. මහා වංශය. 2. කුවේණි අස්න. 3. රාජාවලිය. 4. බුත්සරණ. 5. දීප වංශය. (.........)

34. 1. යත්න. 2. ප්‍රාප්ත්‍යාශා. 3. පතාකා. 4. නියතාප්ති. 5. ඵලාගම. (.........)

35. 1. සිරිසඟබෝ. 2. වෙස්සන්තර. 3. විදුර. 4. කුස. 5. රත්නාවලි. (.........)

36. 1. විදූෂක. 2. උදයන. 3. ගෞතමී. 4. කන්ව ඉර්ෂි. 5. අනසූයා. (.........)

37. ලෝකධර්මි හා නාට්‍යධර්මි යන වර්ගීකරණය අඩංගු වී ඇත්තේ,

1. ඇරිස්ටෝටල්ගේ කාව්‍යශාස්ත්‍රයේ ය. 2. ධනංජයගේ දශරූපකයේය.
3. ප්ලේටෝගේ ජනරජයේය. 4. නන්දිකේශ්වරගේ අභිනය දර්පනයේය.
5. භරතමුනිගේ නාට්‍යශාස්ත්‍රයේය. (.........)

38. නාට්‍ය දර්ශනයක් සාර්ථක වීම සඳහා,

1. නළු නිළියන් සිය සංවාද වනපොත් කොට තිබීම අත්‍යවශ්‍යයය.
2. ආනුෂංගික අංග උපරිමව භාවිතා කළ යුතුය.
3. නළු නිළියන් හා රංග භූමියක් තිබීම ප්‍රමාණවත් වේ.
4. රංග කාලය අසීමිතව තිබිය යුතුය.
5. සියළුම නළු නිළියන් ශායනය හා වාදනය ප්‍රගුණකර තිබිය යුතුය. (.........)

39. රංග වින්‍යාසයට අදාලව නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. නාට්‍යධර්මි සම්ප්‍රදායට පමණක් අවශ්‍යය වේ. 2. වේදිකාව මත නළු නිළියන් පෙළගැස්වීමයි
3. පෙරදිගට ආවේනික ව්‍යවහාරයකි. 4. නාට්‍ය පෙළෙහි සියල්ල සඳහන් වේ.
5. මිනිස්ක්‍රියා, අවකාශය, හා අනුෂංගික සුසංයෝගයක් ගොඩනැගෙන්නකි. (.........)

40. ක්ෂණික නිරූපණය සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ,

1. නිශ්චිතව මාතෘකා සැපයීම අවශ්‍ය වේ.
2. ක්ෂණික නිරූපණය යනු අනුකරණයක් පමණි.
3. පරිකල්පනය අවශ්‍ය වන්නේ නැත.
4. ක්ෂණික නිරූපණය රූපණ කුසලතා වර්ධනය සඳහා අත්‍යවශ්‍යවේ.
5. කුතුහලය ආදී නාට්‍යමය ගුණාංග වැදගත් නොවේ. (.........)

NWP - EXAM



**මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.**

# නාට්‍ය හා රංගකලාව

13 ශ්‍රේණිය - I පත්‍රය

II කොටස

- **A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## A - කොටස

01. i. කුවේණි නාට්‍ය සඳහා පාදක වූ පුරාවෘත කතාව කෙටියෙන් ලියන්න. (ලකුණු 02 යි)
    ii. කුවේණි නාට්‍යයේ නාට්‍යමය අවස්ථා 05ක් නම් කර 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. කුවේණිය ''සදාකාලික දුක්විඳින ගැහැණිය'' ලෙස හැඳින්වීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

02. i සංස්කෘත නාට්‍ය ආරම්භය හා විකාශය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)
    ii. සංස්කෘත නාට්‍යයේ අර්ථෝපක්ශේප නම්කර කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි)
    iii. සංස්කෘත නාට්‍යයේ රංග ශෛලිය විස්තර කරන්න. (ලකුණු 06 යි)

03. i. සංස්කෘත නාට්‍යයක් වන අභිඥාන සාකුන්තලය නාට්‍ය සඳහා යොදා ගත් පුරාවෘත කතාව නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. එම පුරා වෘතයෙන් සකුන්තලා නාට්‍ය වෙනස්වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. සංස්කෘත නාට්‍ය කරුවන් 04ක් නම්කර එක් අයෙක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 06 යි)

## B-කොටස

04. i. මිනර්වා නාට්‍යකරුවන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. මිනර්වා නාට්‍යවල ස්වභාය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. මිනර්වා නාට්‍ය වලින් පසුව ආරම්භ වූ ඉංග්‍රීසි නාට්‍ය කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

05. i. නාඩගම් ආරම්භයට බලපෑ හේතු 02 සඳහන් කරන්න.
    ii. නාඩගම් රඟමඩල ඇඳ නම් කරන්න.
    iii. නාඩගම් අභිභවා නූර්ති ජනප්‍රිය වීමට බලපාන ලද හේතු විස්තර කරන්න.

06. i. හැටේ දශකයේ නාට්‍ය නිර්මාණ කරුවන් 04 නම් කරන්න.
    ii. එම නාට්‍ය කරුවන්ගේ නිර්මාණ 02 බැගින් නම් කරන්න.
    iii. ජයලත් මනෝරත්නයන්ගෙන් නාට්‍යකලාවට වූ සේවාව අගයන්න.

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 | S | II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................  නාට්‍ය හා රංගකලාව II  කාලය පැය තුනයි

උපදෙස්

- I කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු I පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- **පළමු කොටසේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. ලලිතකලාව යන්නෙන් අදහස් කරන්නේ,
    1. භාව ප්‍රකෝපිත කලාවකි.  2. රසවින්දනය අසීරු වූ කලාවකි.
    3. ශිල්පීය වශයෙන් පරිපූර්ණ බවින් යුක්ත කලාවකි.  4. බුද්ධියට ආමන්ත්‍රණය නොකරයි.
    5. ජීවිත අවබෝධය සීමා කරයි. (.........)

02. ගායනය, රංගනය, චලනය පදනම් කරගෙන රංගභූමියක් මත නිරූපණය වන කලාවක් ලෙස ගත හැක්කේ මින්,
    1. ගැමි කලාව.  2. ලලිතකලාව.  3. ජනප්‍රිය කලාව
    4. ප්‍රාසංගික කලාව.  5. ව්‍යවහාරික කලාව. (.........)

03. ගීත නාට්‍ය යනුවෙන් හඳුන්වන්නේ,
    1. අභිනය භාවිතා නොවන කලාවකි.  2. ගායනය ප්‍රමුඛවන නාට්‍ය විශේෂයකි.
    3. මුද්‍රා නාට්‍යයට සමාන නාට්‍ය වර්ගයකි.  4. බටහිර බැලේ අභාසය ලැබූවකි.
    5. රංග රචනය ප්‍රමුඛ වූ කලාවකි. (.........)

04. රූපණයෙහි සාර්ථකත්වය සඳහා රූපණ ශිල්පියා අනිවාර්යයෙන් පුහුණු කළ යුත්තේ,
    1. හඬ හා ස්වසන අභ්‍යාස.  2. ශිථිලකරණ හා සතර අභිනය.
    3. වාචික අභිනය හා සාත්වික අභිනය.  4. රංග ක්‍රීඩා පුහුණුව.
    5. ශිථිලකරණ, සංවේදන හඬ හා පරිකල්පන අභ්‍යාස. (.........)

05. නාට්‍යයක ගැටුම යනුවෙන් හඳුන්වන්නේ,
    1. ප්‍රේක්ෂකයා නාට්‍ය කෙරෙහි දැඩිව රැඳවීමට හේතුවන්නකි.
    2. නාට්‍ය ප්‍රේක්ෂක ප්‍රතිචාර.  3. නළුවන් දෙදෙනෙක් අතර සිදුවිය යුත්තකි.
    4. අවස්ථා පෙළ ගැස්වීමය.  5. ක්‍රියාව තුළ සිදුවන ඒකාත්මික බවයි. (.........)

06. රංග පරම සංගීතය යනුවෙන් අදහස් කරන්නේ,
    1. කාව්‍යයේ චරිත ගීත ගායනා කිරීම.  2. නාට්‍යයේ පසුබිම් සංගීතයයි.
    3. මතුපිට අර්ථය පහදන්නකි.  4. යටිපෙළ අර්ථය මතුකරන සංගීතයයි.
    5. රංගනය අභිභවා යන්නකි. (.........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

07. නාට්‍ය අධ්‍යක්ෂණයට අදාල වන්නේ,
1. මූලිකාංග හා ආනුෂංගික අංග මනාව හසුරුවමින් ප්‍රබල අර්ථයක් සැපයීම
2. උපරිම ලෙස කාලය කැප කිරීමට හැකිවීම.
3. ආඥාදායකු ලෙස කටයුතු කල යුතුය.
4. සමස්ත රංගනයට වගකිව යුතු නොවේ.
5. නායකත්ව හැකියාව අත්‍යාවශ්‍යය. (.........)

08. රංගභූමි තාක්ෂණය ලෙස හඳුන්වන්නේ,
1. වේදිකාව තුළ උපරිම ලෙස යන්ත්‍ර උපකරණ භාවිතයයි.
2. නාට්‍යයෙන් නිරූපිත අවස්ථා තීව්‍ර කිරීම හා චමත්කාර ලෙස ප්‍රේක්ෂාව හැසිරවීම සඳහා තාක්ෂණික භාවිතා කිරීම.
3. ශබ්ධයන් මැනවින් ශ්‍රවනය වීම සඳහා විවිධ වූ උපකරණ භාවිතා කිරීම.
4. නාට්‍යයේ වේදිකා මෙවලම් එහා මෙහා ගෙනයාමේ ක්‍රම වේදයයි.
5. වේදිකාව අවශ්‍ය පරිදි සකස්කර ගැනීමේ ශිල්ප ක්‍රමයයි. (.........)

- **අංක 9 සිට 13 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාල කරගන්න.**

| | | | |
|---|---|---|---|
| A - ඔකෙස්ට්‍රා | F - දොඹකරය | K - ලතින් භාෂාව | B - ටර්ටූලියන් |
| G - Parados | L - Exodos | C - කව්ච්චිය | H - ස්කේන් |
| M - පැරසීයම් | D - Prologue | I - බහුවේදිකා | N - මන්දිර වේදිකාව |
| E - බූත් | J - කොන්ස්ටන්ටයින් | O - එකුක්ලිමා | |

09. මධ්‍යකාලීන නාට්‍ය ආරම්භයට හේතු වී ඇති තොරතුරු සඳහා අදාල වන්නේ,
1. A B හා E ය. 2. E J හා L ය. 3. B J හා K ය. 4. G K හා O ය. 5. A J ය. (.........)

10. ජනවන්දනා නාට්‍ය රඟ දැක්වූ ස්ථාන වන්නේ,
1. C E හා H ය. 2. G I හා M ය. 3. K N හා O ය. 4. B I හා K ය. 5. E I හා N ය.(.........)

11. ග්‍රික නාට්‍ය වේදිකාව හා අදාල වන්නේ,
1. A H හා M ය. 2. A C හා F ය. 3. F H හා J ය. 4. I M හා O ය. 5. DM හා Nය.(........)

12. ග්‍රීක නාට්‍යයේ නාට්‍යයෝපකරණ ලෙස ගත හැක්කේ,
1. B C හා D ය. 2. D E හා F ය. 3. M N හා O ය. 4. C F හා O ය. 5. A E හා L ය.(........)

13. ග්‍රීක නාට්‍යයේ ආරම්භය, ගායන වෘන්ද ප්‍රවේශය සහ වේදිකාවෙන් පිටවීම මෙසේ හඳුන්වන ලදි,
1. A D හා F ය. 2. D I හා K ය. 3. D G හා L ය. 4. I J හා L ය. 5. G I හා K ය.(.........)

14. ''සොයන්නහුද කවුරුන් මේ සොහොනෙහි කිතුනුවනි'' මෙම සංවාදය ඇතුළත් වන්නේ,
1. ආදම් සහ ඒව කතාවේය. 2. මරියාවරුන් තිදෙනාගේ නාට්‍යයේය.
3. සකලජන නාට්‍යයේය. 4. නැව් සදන්නෝ නාට්‍යයේය.
5. දෙව්වරුන් තිදෙනාගේ නාට්‍යයේය. (.........)

- **ප්‍රශ්න අංක 15 සිට 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාල කරගන්න.**

| | | | |
|---|---|---|---|
| A - ඇගමෙමනන් | F - යුමිනයිඩීස් | K - ස්ට්‍රීන්බර්ග | P - ප්ලූටස් |
| B - ඇල්බෙයාකැමු | G - ලයිස්ට්‍රාටා | L - සප්ලයන්ට්ස් | Q - මැක්සිම් ගෝර්කිම් |
| C - ෆ්රැනිකොස් | H - හැරල්ඩ් පින්ටර් | M - බර්නාඩ් ෂෝ | R - ගුන්තර්ග්‍රාස් |
| D - මණ්ඩුකයෝ | I - ඇන්ටන් චෙකොව් | N - ප්‍රටිනස් | |
| E - මොලිස්මිටලින්ක් | J - ඩොයිරිලොස් | O - එමිල් සෝලා | |

15. තෙස්පිස් සමකාලීන නාට්‍ය රචකයින් වන්නේ,
1. A C හා F ය. 2. C F හා G ය. 3. E G හා K ය. 4. N P හා R ය. 5. C J හා N ය.(.........)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.
NWP - EXAM

16. ඊස්කිලස් නාට්‍ය කරුවාගේ නාට්‍ය වන්නේ,
1. B F හා G ය. 2. A D හා E ය. 3. A F හා L ය. 4. J K හා L ය. 5. F H හා J ය.(.........)

17. ඇරිස්ටොෆනිස්ගේ නාට්‍ය වන්නේ,
1. A D හා F ය. 2. D G හා P ය. 3. P Q හා R ය. 4. C G හා N ය. 5. D P හා Q ය. (.........)

18. අසම්මත නාට්‍යකරුවන් වන්නේ,
1. A B හා D ය. 2. D H හා O ය. 3. B H හා R ය. 4. H L හා R ය. 5. N P හා R ය. (.........)

19. යථාර්ථවාදී නාට්‍ය කරුවන් ලෙස හඳුනාගත හැක්කේ,
1. C I හා O ය. 2. A D හා M ය. 3. E G හා M ය. 4. J P හා Q ය. 5. I M හා Q ය. (.........)

20. සංකේතවාදී, ප්‍රකාශනවාදී සහ ස්වභාවිකවාදී නාට්‍ය කරුවන් වන්නේ,
1. E K හා O ය. 2. A E හා H ය. 3. C K හා O ය. 4. O P හා R ය. 5. B හා Q ය. (.........)

21. ශේක්ස්පියර් සමකාලීන නාට්‍යකරුවන් වන්නේ,
1. බෙන් ජොන්සන්, ඇලෙක්සැන්ඩර් ඩූමා රොබට් ග්‍රීන්.
2. තෝමස් කිඩ්, රොබට් ග්‍රීන්, ජොන් ලයිලි.
3. හෙන්රික් ඉබ්සන්, ඇන්ටන් චෙකෝෆ්, රොබට් ග්‍රීන්.
4. ගුන්තර් ග්‍රාස්, එමිල් සෝලා, ක්‍රිස්ටෝෆර් මාලෝ.
5. මැක්සීම් ගෝර්කි, පිලිප් සිඩ්නි, ගුන්තර් ග්‍රාස්. (.........)

22. ශේක්ස්පියර් ගේ ඛේදාන්ත නාට්‍ය වන්නේ,
1. ජූලියස් සීසර්, සිම්බලීන්, ද ටුවෙල්ත් නයිට්.
2. කිංජෝන්, පෙරක්ලීස්, රෝමියෝ ජුලියට්.
3. හැම්ලට්, ඔතලෝ, මැක්බත්.
4. සිම්බලීන්, හැම්ලට්, මෙෂර් ෆෝ මෙෂර්
5. ඔතෙලෝ, සිම්බලීන්, ඇස් යූ ලයික් ඉට්. (.........)

23. එළිසබතීන රංගශාලා වන්නේ,
1. ග්‍රීක් තියටර්, රෝස් තියටර්, බූත් තියටර්.
2. ස්වොන් තියටර්, ත්‍රස්‍ය තියටර්, බූත් තියටර්.
3. කබුකි තියටර්, කර්ටන්, රෝස්.
4. කර්ටන් තියටර්, නෝ තියටර්, ග්‍රීක තියටර්.
5. ෆෝචූන් තියටර්, ස්වොන් තියටර්, කර්ටන් (.........)

24. ශේක්ස්පියර් ගේ නාට්‍යවල ආවේණික ලක්ෂණයක් නොවන්නේ,
1. සර්වකාලීන තේමා තිබීම.
2. අද්භූත සිදුවීම් බහුලවීම.
3. කාව්‍යමය භාෂාවක් භාවිතා වීම.
4. තිරය අඩවන්ව තැබීම.
5. පිටපත අංකවලට හා දර්ශනවලට බෙදා තිබීම. (.........)

- **අංක 25 සිට 27 දක්වා ප්‍රශ්න වලට අදාලව සපයා ඇති නම් අතර සෙසු නාම හා නොගැලපෙන නාමය තෝරන්න.**

25. 1. බූත් වේදිකා 2. ජංගම රථ 3. බූතායි වේදිකා 4. බහු වේදිකා 5. මන්දිර වේදිකා (.........)

26. 1. නත්තල් ගස 2. පියානෝව 3. ගිනි උඳුන 4. තොප්පිය 5. කලු කුරුසිය (.........)

27. 1. බෲටස් 2. හෙන්රි 3. ඇන්ටනි 4. කැසියස් 5. කස්කා (.........)

28. එපික් රංගරීතියේ පුරෝගාමී නාට්‍යකරුවා වන්නේ,
1. අර්වින් පිස්කැටර්.
2. ආතර් මිලර්.
3. ඉයුජින් අයනෙස්කෝ.
4. ගුන්තර් ග්‍රාස්.
5. බ්‍රර්ටෝල් බ්‍රෙෂ්ට්. (.........)

29. ජූලියස් සීසර් නාට්‍යයේ සීසර් ගේ ශක්තිය හා තීරණා වෙනස් නොකිරීම පිළිබඳව ඔහු සමාන කරන්නේ,
1. හත්දින්නත් තරු හා එවරස්ට් කන්දටය.
2. වල්ගා තරුව හා හිමාල කන්දටය.
3. කොකේන් තාරකාව හා ඔලිම්පස් කන්දටය.
4. දූම කේතුව හා එවරස්ට් කන්දටය.
5. ධ්‍රැව තාරකාවට හා ඔලිම්පස් කන්දටය. (.........)

30. එළිසබතින යුගයේ ග්ලොබ් රඟහලේ වේදිකාව අයත් වන්නේ,
1. ඒප්‍රනාකාර. 2. එළිමහන්. 3. වෘත්තාකාර. 4. චතුරස්‍රාකාර. 5. ත්‍රිකෝණාකාර. (.........)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

31. ''ඔබට ඔබ නොපෙනෙන නිසා මම ඔබේ කැඩපත වන්නම්'' මෙම සංවාදය පවසන්නේ,
1. බෘටස්. 2. සීසර්. 3. ඇන්ටනී. 4. කැසියස්. 5. ඔක්ටේවියස් (.........)

32. ''කුණාටුව මැකිල ගියගමන් එහෙම කිසිම දෙයක් නොවුන ගානට ඔයා හිටියා''මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ,
1. නුව්රා. 2. ලින්ඩෙ. 3. අන්මරි. 4. හෙල්ම. 5. රන්ක්. (.........)

33. ''අනේ ඉවත් නොකරන්න උන් මා කෙරෙන්'' මෙම සංවාදය පැවසූයේ,
1. යොකස්ට්‍රා. 2. හීමන්. 3. ඊඩිපස්. 4. යුරිඩීස්. 5. ලායුස්. (.........)

34. ඊඩිපස් නාට්‍යයේ අභාග්‍ය සම්පන්න සිද්ධි මාලාව ආරම්භ වන්නේ,
1. හිමන්ගේ පණිවිඩයෙන් පසුවය. 2. කොරින්තයේ පණිවිඩ කරුවාගෙන් ආ සුභ ආරංචියෙන් පසුවය.
3. ටෙරේසියාස් නික්මයාමෙන් පසුවය. 4. ජොකස්ටා බිසව මුණගැසීමෙනි.
5. මන්ත්‍රකාරියගේ පැන විසඳීමෙනි. (.........)

35. වර්ථමාන සමාජය තුළ දැකිය හැකි ආර්ථික ගැටලු කඩා හැලෙන ප්‍රේමසම්බන්ධතා, කලකිරීම් ආදී ලක්ෂණ චරිත වලින් පෙන්වා දී ඇත්තේ,
1. - රූකඩ ගෙදර නාට්‍යයේ නුව්රා රන්ක් වැනි චරිත වලිනි.
2. - ඊඩිපස් නාට්‍යයේ යොකස්ට්‍රා ඊඩිපස් චරිත තුලිනි.
3. - ජුලියස් සීසර් නාට්‍යයේ බෘටස් පෝෂියා චරිත තුලිනි.
4. - ජුලියස් සීසර් නාට්‍යයේ සීසර් කැල්පර්නියා චරිත තුලිනි.
5. - රූකඩ ගෙදර නාට්‍යයේ ක්‍රොග්ස්ටඩ් ලින්ඩෙ වැනි චරිත වලිනි. (.........)

36. ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය සඳහා වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. ග්‍රීක නාට්‍ය සියල්ලම ගද්‍යයෙන් රචනා විය.
2. ග්‍රීක ශෝකාත්ම නාට්‍ය බොහෝමයක් රචනාවී ඇත්තේ පශ්චාත් දෘෂ්ටි කථන ක්‍රමයටය.
3. ශෝකාන්තය භාව පෙරලියෙන් තොරය.
4. ශෝකාන්ත අධ්‍යක්ෂවරයා සූත්‍රධර නම් විය.
5. ඇරිස්ටෝටල් භාවයන් අටක් පිළිබඳව සඳහන් කර ඇත. (.........)

37. ඩිතිරැම්බෝස් යනුවෙන් හඳුන්වා ඇත්තේ,
1. දියෝනියස් දෙවියා සඳහා භාවිතා කළ නාට්‍යයකි. 2. තෙස්පීස් නළුවකු ලෙස සහභාගී නොවුනි.
3. ඇපලෝ දේව වර්ණනාවකි. 4. ගායන වෘන්දය එළු වෙස්ගන්නා ලදි.
5. මිදියුෂ බී ඔද වැඩුනු දෙවියෙකි. (.........)

38. ඇරිස්ටෝටල්ට අනුව,
1. කවියා සතුව අනුකරණ විධි පහක් වේ.
2. පහත් මිනිසුන් අනුකරණය කිරීම අනුකරණයයි.
3. ප්‍රකෘති තත්වයට වඩා උසස් මිනිසුන් අනුකරණය කරයි.
4. ශෝකෝත්පාදකය යනු උත්තුංග ක්‍රියාවක් අනුකරණය කිරීමයි.
5. කාව්‍ය ශාස්ත්‍රයේ අනුකරණය පිළිබඳව සඳහන් නොවේ. (.........)

39. වේදිකාව තුල ආලෝකය භාවිතා කිරීමේදී ප්‍රේක්ෂකයා තුළ විශ්මය ජනක හා අත්භූත බව මතු කරන පහන් වර්ගය වන්නේ,
1. යොමු පහන. 2. වර්ණ චක්‍රය. 3. අල්ට්‍රාවයලට් පහන.
4. සෙවනැලි නිර්මිත පහන. 5. හැලජන් පහන. (.........)

40. ස්ටැනිස් ලාවුස්කි ඔහුගේ රූපණ විධික්‍රමයේ සඳහන් කරන්නකි,
1. භාෂණ ක්‍රම භාවිතය. 2. රස භාවිතය. 3. යෝගි අභ්‍යාස.
4. පාවෙන ඉරණම. 5. භාවමය ස්මෘතිය. (.........)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

**පළමු වාර පරීක්ෂණය - 2020**

**නාට්‍ය හා රංගකලාව**

13 ශ්‍රේණිය - **II** පත්‍රය

**II** කොටස

- **A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## A - කොටස

01. i. ප්‍රාසංගික කලාවේ ලක්‍ෂණ 04ක් ලියන්න. (ලකුණු 04 යි)
    ii. ප්‍රාසංගික කලා සහ ප්‍රාසංගික නොවන කලා අංග තුළ ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
    iii. ''ප්‍රාසංගික කලාවන් අතර නාට්‍ය කලාව යනු සාමූහික කලාවකි'' විමසන්න. (ලකුණු 06 යි)

02. වේදිකා නාට්‍ය නිර්මාණයකදී ආනුෂංගික කලා අංගවල දායකත්වය අනිවාර්ය වේ.
    i. එම ආනුෂංගික අංග 06ක් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. එම ආනුෂංගික අංග 02ක් පිළිබඳව නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. ආනුෂංගික අංග නාට්‍ය සඳහා දායක කරගෙන ඇති ආකාරය ඔබ නැරඹූ ලෝකධර්මී නාට්‍යයක් ඇසුරෙන් හෝ නාට්‍යධර්මී නාට්‍යධර්මී නාට්‍යයක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 06 යි)

03. i. නාට්‍ය විචාරය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
    ii. නාට්‍ය විචාරයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 05 යි)
    iii. රූපණය පිළිබඳ විචාරයේදී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

## B - කොටස

04. i. ග්‍රීක නාට්‍ය ආරම්භය හා විකාශය පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
    ii. ග්‍රීක නාට්‍ය කරුවන් අතරින් නාට්‍යකරුවන් දෙදෙනකු පිළිබඳව අගයන්න. (ලකුණු 05 යි)
    iii. ඊඩිපස් නාට්‍යයේ ඉරණම් පෙරළිය සිදුවීම ආරම්භයේ සිට අවසානය දක්වා ඊඩිපස් ගේ චරිත ස්වභාවය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

05 i. ශේක්ස්පියර් සමකාලීන නාට්‍යකරුවන් දෙදෙනෙක් අගයන්න. (ලකුණු 04 යි)
    ii. ශේක්ස්පියර් නාට්‍ය වර්ග නම් කර නාට්‍ය වර්ග 03 සඳහා උදාහරණ 03 බැගින් නාට්‍ය නම් කරන්න. (ලකුණු 05 යි)
    iii. එම නාට්‍ය වර්ග අතරින් ජූලියස් සීසර් නාට්‍ය කුමන නාට්‍ය වර්ගයට අයත් දැයි හඳුන්වා ශේක්‍ෂපියර් නාට්‍යවල ලක්‍ෂණ පෙන්වාදෙන්න. (ලකුණු 06 යි)

06. i. යුරෝපයේ ප්‍රකට රංග රීති 04ක් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. ඉබ්සන් නියෝජනය කළ රංග රීතියේ සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. රූකඩ ගෙදර නාට්‍යයේ රූකඩිය වශයෙන් හැඳින්වෙන්නේ කවුදැයි නමකර එසේ රූකඩිය වීමට හේතු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

# නාට්‍ය හා රංගකලාව - 2020 - පෙරහුරු පරීක්ෂණය
## 13 ශ්‍රේණිය - I පත්‍රය

**<u>1 කොටස - පිළිතුරු</u>**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 1 | 11. | 4 | 21. | 5 | 31. | 1 |
| 2. | 3 | 12. | 2 | 22. | 3 | 32. | 2 |
| 3. | 2 | 13. | 1 | 23. | 4 | 33. | 4 |
| 4. | 5 | 14. | 3 | 24. | 5 | 34. | 3 |
| 5. | 3 | 15. | 5 | 25. | 2 | 35. | 5 |
| 6. | 5 | 16. | 1 | 26. | 1 | 36. | 2 |
| 7. | 4 | 17. | 4 | 27. | 3 | 37. | 5 |
| 8. | 2 | 18. | 2 | 28. | 4 | 38. | 1 |
| 9. | 1 | 19. | 5 | 29. | 5 | 39. | 5 |
| 10. | 3 | 20. | 2 | 30. | 1 | 40. | 4 |

**1 පත්‍රය - 11 කොටස.**

### A– කොටස

01. i. විජය කුවේණි සම්බන්ධ කෘති ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

ii. විජය කුවේණි අතර ගැටුම.
කුවේණිය දරුවන් සමඟ මාලිගයින් පිටවීම.
නෑදෑයින්ගෙන් අවමන් ලැබීම.
දරුවන් වනගත වීම.

iii. එදා, අද, හෙට, උවද දුක් විඳින ගැහැණිය හඳුන්වන්නේ කුවේණිය බවට උදාහරණ සහිතව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

02. i. නාට්‍ය ශාස්ත්‍රයට අනුව නාට්‍යකලාවේ ප්‍රභවය දිව්‍යමය ප්‍රභවයකි. සැමට රස විඳිය හැකි වේදයක් මහා බ්‍රහ්මය ගෙන් ඉල්ලූ අතර වේද සතරෙන් කොටස් ගෙන නාට්‍ය වේදය නිර්මාණය කරන ලදි.
ඍග් වේදයෙන් වචනද සාමවේදයේ ගීතයද යජුර් වේදයෙන් අභිනයද අතර්වන් වේදයෙන් රසයද ආදී ලෙසිනි.
මහා බ්‍රහ්මයාගේ අන පරිදි විශ්වකර්ම දෙව් රඟහලක්ද ශිව දෙවි තාන්ඩව නැටුමද, පාර්වතී ලාස්‍ය නැටුමද විශ්ණු දෙවි සිව් වැදෑරුම් නාට්‍ය රීතියද යොදමින් නාට්‍ය නිර්මාණය කර ඇති බව සඳහන් කරයි නම් ලකුණු ලබා දෙන්න.

ii. ප්‍රවේශක, විශ්කම්භක, අංකමුඛ, අංකවතාර, චූලිකා ලෙස නම්කර කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

iii. රංග ශෛලිය එනම් සංස්කෘත නාට්‍යයේ ස්වභාවය විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.
නාට්‍යධර්මී ස්වභාවය
භාෂණ විධි භාවිතය
භාෂණ විධි භාවිතය
මුද්‍රා භාවිතය
වේදිකා භාවිතය ආදී කරුණු ඇතුලත් විය යුතුය.

03. i. සකුන්තලෝපාඛ්‍යානය

ii. සාකුන්තලය.

- චරිත ගොඩක් ඇත
- සකුන්තලා අහිංසක චරිතයකි
- දරුවා කුසදරා රජු හමුවේ
- සාපයක් නිසා රජුට සකුන්තලාව අමතක වේ.
- ආදරය නිසාම විවාහයට කැමති වේ.
- ධීවරයාගේ සිදුවීමෙන් පසු රජුම නැවත
  මතකය ලැබී සකුන්තලාව සොයාගෙන ගොස් හමු වේ.

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සකුන්තලෝපාඛ්‍යානය

- චරිත කිහිපයක් ඇත
- අවිහිංසක නොවන චරිතයකි
- දරුවාට අවු.6ක් ගිය පසු රජු මුණගැසේ
- සාපයක් පිළිබඳ නොකියවේ
- ලැබෙන පුතු යුවරජු කිරීමට කැමති වී විවාහටය එකඟවේ.
- ඉහලින් ආ හඬට බය වී සකුන්තලාව භාරගනී.

මේ ආකාරයට වෙනස්කම් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. භාස, කාලිදාස, ශුද්‍රක ශ්‍රී හර්ෂ
මේ නාට්‍යකරුවන් අතරින් එක් අයෙක් පිළිබඳව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

04. i. B.A.W.ජයමාන්න එඩී ජයමාන්න

ii. නාට්‍යයේ ස්වභාවය කෙටියෙන් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. මිනර්වා වලින් පසුව ඉංග්‍රීසි උගත් ප්‍රේක්ෂක පිරිසක් බිහිවූ අතර විශ්ව විද්‍යාල කොලිජියේ මහාචාර්යවර E.F.C. ලුඩෝවයික් වහතාගේ මැදිහත්වීමෙන් ඉංග්‍රීසි නාට්‍ය කලාව ආරම්භ වී ඒ තුළ ව්‍යාප්ත වූ ආකාරය කෙටියෙන් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

05. i තෙරික්කුත්තු විදි නාට්‍ය ආභාසය
අලගනායිඩු පැමිණීම
ජනවන්දනා නාට්‍ය අභාසය
ක්‍රිස්තියානි ආගමික ආභාසය

ii. රඟමඩල ඇඳ නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii.

- පැය කිහිපයකට සීමා වීම.
- පහසුකම් සහිත රංග ශාලාවක රංගගත වීම.
- තාක්ෂණික උපක්‍රම භාවිතය.
- පළමු වරට කාන්තා චරිත කාන්තාවන් රගපෑම.
- උතුරු ඉන්දීය රාගධාරී සංගීතය භාවිතය.
- විචිත්‍ර ඇඳුම් පැළඳුම් සහ පසුතල භාවිතය.

ආදී ලෙස කරුණු විස්තරාත්මකව ලියා ඇත්නම් මුළු ලකුණු ලබාදෙන්න.

06. i දයානන්ද ගුණවර්ධන
සුගතපාල ද සිල්වා
ආර්. ආර්. සමරකෝන්
හෙන්රි ජයසේන ආදී..

ii. ඔවුන්ගේ නිර්මාණ 02 බැගින් සඳහන් කරයි නම් ලකුණු ලබාදෙන්න.

iii. ජයලත් මනෝරත්නයන්ගෙන් නාට්‍යකලාවට වූ සේවාව අගයමින් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

# නාට්‍ය හා රංගකලාව

## 13 ශ්‍රේණිය - II පත්‍රය

**I කොටස - පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| 1. 3 | 11. 1 | 21. 2 | 31. 4 |
| 2. 4 | 12. 4 | 22. 3 | 32. 1 |
| 3. 2 | 13. 3 | 23. 5 | 33. 3 |
| 4. 5 | 14. 2 | 24. 4 | 34. 2 |
| 5. 1 | 15. 5 | 25. 3 | 35. 5 |
| 6. 4 | 16. 3 | 26. 4 | 36. 2 |
| 7. 1 | 17. 2 | 27. 2 | 37. 1 |
| 8. 2 | 18. 3 | 28. 1 | 38. 4 |
| 9. 3 | 19. 5 | 29. 5 | 39. 3 |
| 10. 5 | 20. 1 | 30. 1 | 40. 5 |

**II කොටස - පිළිතුරු**

A - කොටස

01. i. සජීවී කලාවක් වීම.
අභිනය භාවිතය
නිශ්චිත ස්ථානයක නිශ්චිත කාලයකදී ප්‍රේක්ෂක පිරිසක් ඉදිරිපිට ශ්‍රව්‍ය දෘෂ්‍ය සජීවීව ඉදිරිපත් කිරීම
ඍජු ප්‍රේක්ෂක සම්බන්ධය
ශිල්පීය කුසලතා මූලික වීම
රසාස්වාදය ලබා දීම

ii. ප්‍රාසංගික කලා - නර්තනය, සංගීතය, මුද්‍රා නාට්‍ය, නාට්‍ය, බැලේ නාට්‍ය ආදී
ප්‍රාසාංගික නොවන කලා - සිනමාව, ටෙලිනාට්‍යය, සාහිත්‍ය චිත්‍ර මූර්ති ආදී ලෙස කලාවන් ගෙන ඉන් තුනක්වත් සන්සන්දනය කරමින් පිළිතුරු ගලපා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. නාට්‍ය කලාවට සෙසු කලාවන්ගේ දායකත්වය ලැබෙන ආකාරය සඳහන් කර එම හේතුව නිසා නාට්‍ය කලාව යනු සාමූහික කලාවල එකතුවක් බව විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.

02. i. අංගරචනය
වේෂ භූෂණ
රංගාලෝකය
වේදිකා පසුතල
රංගභූමි තාක්ෂණය
රංග වින්‍යාසය ආදී

ii. ඉහත නම් කරන ලද අංග 02ක් පිළිබඳව නිදසුන් සහිත විස්තර කරයි නම් ලකුණු ලබාදෙන්න.

iii. නැරඹූනාට්‍යයක ආනුෂංගික අංග යොදාගෙන ඇති ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

03. i. නාට්‍යයේ වස්තුව, එහි රංග ශෛලිය, තේමාව, ගැටුම හා නාට්‍යයෝචිත අවස්ථා ආදී අංග කෙතෙක් දුරට ගැලපේද යන්න විශ්ලේශනාත්මකව විග්‍රහකරන අතර ඒ කරුණු පදනම් කරගෙන නාට්‍යයේ සාධනීය ලක්ෂණ හා අඩුපාඩු පිළිබඳ අදහස් දැක්වීම විචාරය ලෙස හැඳින්වේ.

ii. *නාට්‍යයට පදනම් කරගත් නාට්‍ය වස්තුව කුමක්ද
*නාට්‍ය පෙළට අදාලව යොදාගත් රංග ශෛලිය කෙතරම් දුරට සාර්ථකද
*නාට්‍යයේ තේමාව හෝ තේමා හෝ කවරේද
*එම තේමා සමාජයේ පැවැත්මට කෙබඳු හරයක් ලබාදේද.
*යටිපෙළ උද්දීපනය කිරීම සඳහා රචකයා භාෂාව භාවිතා කර ඇත්තේ කෙසේද?
*නාට්‍යයේ ගැටුම් අවස්ථා කෙසේ නිර්මාණය වී ඇත්දද යන්න, ආදී ලෙසින් අදාල පරිදි ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. * භූමිකාවල රගන නළු නිළියන් ඉදිරිපත්කරන නාට්‍ය රීතියේ අවශ්‍යතාවයට අනුව චරිතයේ බාහිර අභ්‍යන්තර චරිත ලක්ෂණ වේ.
* සමාරෝපය කෙබඳුද
* මනෝභාවයන් කෙතෙක් දුරට සාර්ථකද
* චරිතයට සාධාරණයක් ඉටු කළේද


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

* නාට්‍ය රසය කෙසේවේද ඒ සඳහා රූපණය කෙසේ ඉවහල් වීද
* රූපණ ශිල්පියා අභින යොදාගන්නේ කෙසේද
* රූපණ ශිල්පියාගේ ආනුෂාංග භාවිතය, ඒවා රූපණය තීව්‍ර කරයිද ආදී ලෙසින් අදාල ලෙස කරුණු ගලපා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

## B - කොටස

04. i. දියෝනිසස් පුද පෙළහර සහිතව නාට්‍ය ආරම්භ වී සිතිරැම්බය හරහා තෙස්පීස් පළමු නළුවා වීමත් ඉන්පසුව නාට්‍යකරුවන් බිහිවීමත් ඔහුන්ගේ නිර්මාණ නාට්‍ය කලාව ජයගත් අයුරුත් කෙටියෙන් පවසා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

ii. සොෆොක්ලිස්, යුරිපිඩීස්, ඇරිස්ටෝපනිස්, ඊස්කිලස් අතරින් දෙදෙනෙකුගේ නිර්මාණ සහ ඔහුගේ මෙහෙය අගයා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

iii. ඊඩිපස් ලායුස් ඝාතකයා සෙවීම ආරම්භකළ මොහොතේ සිට ඊඩිපස් ඛේදය කරා ගමන් කළ ආකාරය විස්තර කරන්න.

05. i. ක්‍රිස්ටෝපර් මාලෝ
තෝමස් කිඩ්
රොබට් ග්‍රීන්
රෝන් ලයිලි
බෙන් ජොන්සන්
දෙදෙනෙක් පිළිබඳව කෙටියෙන් විස්තර කරයි නම් ලකුණු ලබාදෙන්න.

ii. ඛේදාත්මක නාට්‍ය - හැම්ලට්, ඔතෙලෝ, රෝමියෝ ජුලියට් ආදී
සුඛාත්ම නාට්‍යය - ඇස් යු ලයික් ඉට්, ද ටුවෙල්ත් නයිට්, මර්චන්ට් ඔෆ් වෙනිස්, මිඩ්සමර් නයිට් ඩ්‍රීම් ආදී
ඓතිහාසික නාට්‍ය - තුන්වන රිචඩ්, දෙවන රිචඩ්, හයවන හෙන්රි ආදී
විචිත්‍රාද්භූත නාට්‍ය - පෙරක්ලිස්, සිම්බලීන්, ටෙම්පස්ට්, විනටර්ස් ටේල් ආදී
ආවේගාත්ත නාට්‍ය - ඕල්ස් වෙල් දැට් එන්ඩ්ස් වෙල් මේෂර් ෆෝ මේෂර්

iii. * නාට්‍ය පිටපත අංකවලට හා දර්ශනවලට බෙදා තිබීම
* පසුතල භාවිතා නොවීම
* සමාජයේ සෑම චරිතයක්ම අන්තර්ගතවන ලෙස චරිත නිර්මාණය කිරීම.
* කාව්‍යමය භාෂාවක් උපයෝගී කරගැනීම
* අද්භූත සිදුවීම් බහුල වීම
* ප්‍රභූන් ප්‍රධාන චරිත වීම
* ඔවුන්ගේ ඛේදනීය අවසානය
* සර්වකාලීන තේමා තිබීම
* ග්ලොබ් රඟහල යොදාගැනීම
* ආදී ලෙස උදාහරණ සහිතව ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

06. i. ස්වභාවිකවාදී රංගරීතිය
යථාර්ථවාදී රංගරීතිය
එපික් රංගරීතිය
විකාරරූපි රංගරීතිය
රොමැන්ටික් රංගරීතිය ආදී

ii. චරිත හා සිදුවීම් සහේතුක වීම
කාලය හා අවකාශය තර්කානුකූලවීම
ප්‍රේක්ෂකයා තත්වානුරූපී මායාවට යටත්වීම
සාමාන්‍ය ජීවිතයේ භාවිත සංවාද යොදා ගැනීම
ආදී ලෙස නාට්‍යක් උදාහරණයට ගෙන අවස්ථා මතුකරමින් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

iii. රූකඩ ගෙදර නාට්‍යයේ රූකඩිය ලෙස හැඳින්වෙන්නේ නෝවුරා ය. පුරුෂාධිපත්‍ය රජයන සමාජයක නෝරාට සිදුවන්නේ අන් අය අත නැටවෙන රූකඩයක් මෙන් කටයුතු කිරීමටය. අන් අයගේ ඕනෑ එපාකම් අනුව ජීවත් වීමටය. පියාගෙන් පසු ස්වාමියාට අවශ්‍ය ලෙස ජීවිතය ගෙවීමට සිදු වූ ඇයට ස්වාධීනව තීරණ ගෙන කටයුතු කිරීමට ඉඩක් නොලැබුණි.
නාට්‍ය පිටපත ඇසුරින් උදාහරණ දක්වමින් පිළිතුරවිදිරිපත් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.


WWW.LOL.LK
BUY
PAST PAPERS
071 777 4440
Buy Online - www.LOL.lk
• GCE O/L • PAST PAPERS
• GCE A/L • SHORT NOTES

Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

HUGE SALE – SHOP NOW




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00